# මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# උපකුලපති තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 (1) වගන්තිය ප්‍රකාරව සහ එහි පසු සංශෝධන පරිදි මොරටුව විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙකු වේ. උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන ශාස්ත්‍රීය නිලධාරියා සහ ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා වේ. ඔහු / ඇය නිල බලයෙන් පාලක සභාව සහ සනාතන සභාව යන දෙකෙහිම සාමාජිකයෙක් සහ සභාපතිවරයා වේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සංශෝධන ප්‍රකාරව, උපකුලපතිවරයා සේවා කාලය අවසන් වීමට ප්‍රථමයෙන් සේවය අත්හැරියහොත් හෝ තනතුරින් ඉවත් කළහොත් හැර, වසර තුනක කාලයක් හෝ ඔහු/ඇය සිය හැටපස්වන විය සම්පූර්ණ කරන තෙක් යන දෙකෙන් පළමුවෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ. උපකුලපතිවරයා අධ්‍යයන නායකත්වය සැපයීම, කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම, පවත්වාගෙන යාම සහ හඳුන්වා දීම සහ පාලක සභාවේ තීරණ ක්‍රියාවට නැංවීම, විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර, එබැවින් අධ්‍යයන විශිෂ්ටත්වයේ මූලධර්ම, පාරදෘශ්‍යභාවය, වගවීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය සහ ඵලදායී පක්ෂග්‍රාහී නොවන නායකත්ව මූලධර්ම පවත්වා ගත යුතු වේ.

ප්‍රබල පර්යේෂණ පැතිකඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග සහ විවිධ වූ උනන්දුවක් දක්වන කණ්ඩායම් සමග වාස්තවිකව කටයුතු කළ හැකි අන්තර්පුද්ගල නිපුණතා, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධව පැහැදිලි අවබෝධයක් සහ තීරණ සඵලදායීව ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළුව, උසස් ශාස්ත්‍රාලීය ජයග්‍රහණ වාර්තාවක් සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතු වේ. ප්‍රජාව කෙරෙහි කැපවීම ඇතුළුව, විශ්වවිද්‍යාලයක ගුණාත්මකභාවය සහ මෙහෙවර පිළිබඳව ගැඹුරු අවබෝධයක් ද ඔහු/ඇය සතුව තිබිය යුතු ය. (විස්තර සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවිය http://www.uom.lk වෙත පිවිසෙන ලෙස අපේක්ෂිත අයදුම්කරුවන්ට ආරාධනා කෙරේ).

උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ඉහළම අධ්‍යයන වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, මූලික වැටුපෙන් 15%ක සංග්‍රහ දීමනාව සහ තනතුරට අදාළ විය හැකි වෙනත් දීමනා සහ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ලබයි.

පත් කිරීමේ ක්‍රියාවලිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද **2023.04.10 දිනැති අංක 03/2023 දරන කොමිෂන් සභා චක්‍රලේඛය කරුණාකර**

https://www.ugc.ac.lk/attachments/2442_Commission%20Circular%20No.%2003-2023.pdf හි දී බලන්න.

අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දින වන විට වයස අවුරුදු 63ට අඩු විය යුතු ය. අයදුම්පත් සමග පහත ලේඛන ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්කරු අවම වශයෙන් මිනිත්තු දහයක (10) කාල සීමාවක නමුත් මිනිත්තු පහළොවක (15) කාලසීමාව නොඉක්මවන ඉදිරිපත් කිරීමක් විශ්වවිද්‍යාල පාලක සභාව ඉදිරියේ සිදු කළ යුතු ය.

1. උපන් දිනය ඇතුළුව අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත විස්තරය.
2. විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා වූ දැක්ම පිළිබඳ ප්‍රකාශයක් සහ උපකුලපති තනතුරට පත් වුවහොත්, අපේක්ෂකයා විසින් ඉටුකර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ ප්‍රකාශයක්.
3. වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු නම් හෝ අයදුම්කරු මීට පෙර විශ්වවිද්‍යාල උපකුලපති තනතුර හොබවා ඇත්නම්, ඔහුගේ / ඇයගේ පළමු නිල කාලය තුළ ලබා ගත් ජයග්‍රහණ ඉස්මතු කරන වාර්තාවක්.
4. මොරටුව විශ්වවිද්‍යාලය හැර රාජ්‍ය සේවය, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනවල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු නම්, ඔහු / ඇය එම තනතුරට පත්කිරීමේ දී අයදුම්කරු නිදහස් කළ හැකි ද යන්න සඳහන් කරමින් සේවායෝජකයාගේ ලිපියක්.

ඉහත ඉල්ලා ඇති පරිදි අදාළ ලේඛන සහිත අයදුම්පත් 2023.06.06 දින ප.ව. 3.00 ට පෙර ලේඛකාධිකාරී, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව, 10400 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම සිදු කළ යුතුය. ඊට අමතරව, ඉහත ලේඛනවල මෘදු පිටපතක් සහ වෙනත් යම් සහායක ලේඛන PDF ආකෘතියෙන් registrar@uom.lk ඊමේල් ලිපිනයට යොමු කළ යුතුය.

අයදුම්පත සහ අනෙකුත් ලේඛන අඩංගු ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"උපකුලපති තනතුර"** ලෙස සඳහන් කළ යුතු වේ.

**කේ. සී. එස්. පෙරේරා මිය**
**වැඩබලන ලේඛකාධිකාරී සහ පාලක සභාවේ ලේකම්,**
**මොරටුව විශ්වවිද්‍යාලය**

**2023.05.07**